කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 නොවැම්බර් - 2023 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

සිංහල (පැරණි නිර්දේශය)

# භාෂා පරිණාමය, පුරාක්ෂර විද්‍යාව හා කලාශිල්ප SINH – E 3025

පළමුවන ප්‍රශ්නය ද, දෙවන හා තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

## I කොටස

01. පහත සඳහන් ශිලා ලේඛන පාඨයන්හි අදහස ලිහිල් බසින් ලියන්න.
(පළමුවන ප්‍රශ්නය සඳහා පැයක පමණ කාලයක් සෑහේ.)

(අ) පරුමක පොතිමශහ පුත උතිය ච ශොමදෙවහ ච
අගත අනගත ශගශ

ගමික උදයහ ඣය උපශික තිශය ලෙණෙ ශගශ

දෙවනපිය මහරඣ ගමිණි අබයශ පුත ලොණපි අය
ශිවශ ලෙණෙ ශගශ

මහරඣහ ගමිණි තිශහ බරිය උපශික රමදතය ලෙණෙ
ශගශ

ගමණි උති මහරඣ (ඣිත අබි ති) ශය ලෙණෙ දශ දිශශ
සගයෙ
මතපිතශ අටය (ලකුණු 10 යි)

(ආ) සෙසු බියෙන් වන් කෙනෙකුන්
ඇත ගෙ දඬ නොගන්නා ඉසා දෙස් නො යවනු ඉ

සා රජ්කොලෙන් බහා බුජ් සස්නෙහි අනුසසැ බැන්දැ දුන්
පමණු උදහසැ නො ගන්නා ඉසා කැමිකම් කළවුන්

ගම් පාට්ට වැළැන්දූවන් සඟුන් කරා වන විචාරකොට් ගත
යුතු ණයක් ගනුත් මුත් සෙසු නිගා නොකරනු ඉසා සඟු

න් වාසකරන අවසැ රදොලෙන් යවාදිහි මිනිස්නට් නවා තැන්
නො ගෙනැ දෙනු ඉසා සඟ්කළ අවස් පුගුල් නොකර

නු ඉසා අපිළිසරණ වත්හිමියන් ඉසා ලාභ ලදුවන් ඉසා අවස්
ලදුවන් ඉසා කළහ යන වරදක් අතපුවා

ත් මුළු සඟුන් හින්දැ නිමවනු ඉසා සඟුන් විසින් නො නිමත්
සම්දරුවන් හා මුල්වැ විචාරකොට් නිමවා පත් පත්

සෙයින් දඬුවම් කරනු ඉසා සඟුන් හම්බු ආමා කරන විවාදයක්
ඇත සම්දරුවන් යවා සඟුන් සමාහි

ත කොට් හම්බු ගන්වත් මුත් බලකරින් හම්බු නො ගන්වනු
ඉසා මෙකී දැයින් එකකුද් රදොල් නො යෙ

ද්මෙන් කළ කෙනෙකුන් ඇත කලවුන් මෙහෙයින් පහකරනු
ඉසා රදොල් යෙද්මෙන් කළ එය් කැරුණ් වෙහරට්

රජ්කොලෙන් පයලක් දී හම්බු ගන්වනු ඉසා (ලකුණු 10 යි)

(ඈ) ගම්ලද්දන් ගැත්ත -
-ත් මඤඩින් හිඳැ වි
-තාර කොට පිරිකපා
ත(බා) දූන් දඩ ගනුත්
මිසැ ගම වටා ගෙනැ
ගෙ තිරැ ගෙනැ දඩ
නො එල්වනු ඉසා (1*)
දඩ ගැමැ හිඳැ එ (ළ්)-
-වත් මිසැ කුඩින්
ගැමින් පිටත් කොට
නො ගෙනැ යනු ඉසා (1*)
නොපිරිකැපූ දඩට
වැලැක්මෙ නො ගන්-
-නා කොට ඉසා (1*) ලී
දඩට ස්වාමි ගිනු-
-ත් මිසැ අබුදරු
-වන් වැලැක්මෙ නො
ගන්නා ඉසා (1*) ගම-
-ට් ආ රදොලන් රහ
මස් දිහි තෙල් නො
ගන්නා ඉසා (1*) වතු-
පෙත් වෙත් වැදැ රහ
නොගන්නා ඉසා (1*)
සොරවෙළඳම් නො
කරනු ඉසා (1*) පොහො-
දා සල් කළාකුගෙ-
-න් වැපුදයට් තෙ-
-ල් පද්දක් ගන්නා
ඉසා

(ලකුණු 10 යි)

(ඇ) ශ්‍රී: සිරිබර් කැත්කුල කොත් ඔකාවස් රජ්පරපුරෙ
න් බට් කැත්උසබ්නට් අග්මෙහෙසුන්වූ ලක්දිව් පොළො
යෝන පරපුරෙන් හිම්වූ සිරිසඟ්බො අභා මහරජ්හු
පුත් සිරිසඟ්බො අභය් මහරජ්හු සත් ලැගු (නව)ව
න හවුරුදුයෙහි උන්ද්වප් සන්ද් පෙරෙ අඩ් (ම)ස්හි ද(ස)
පක් දවස් උතුරු පසැ අම්ගම්කුළියෙහි කිබි(නිල)
මිහි දෙමෙල්වෙහෙර් පමණියෙන් දසගමට් එකෙක
නායකයන් කිබිගම් ඇප දූන් නායකයන් කුඩි
ත් මෙහි ඇතුළත්තාක් තැනැ කුහිවකු මරා කෙ(ටුව)
කඬපළා සොරකම් කළ තිරැ කොට් ගෙනැ දස ගැමැ ඇ
ත්තන් හින්දැ විචාරා උපන් දැයට් පැ හැකිසේ ලියා
තබා මැරුවෙහු මරා පට්වනු කොට් ඉසා කඬපළා සොරු
න් ගත් අයතියෙන් නියතකළාක් අයිතිය (හි)මි
හට් ගෙන දී එල්වනු කොට් ඉසා තිරැ නොකළ දසගැ
මැ ඇත්තන් පන්සාලිස දවසෙකින් සොයා ගෙනැ පට්
වනු කොට් ඉසා සොයා නො ගත දස ගැමින් එක්
සිය පස්විසි කළන්දක් රන් රදොලට් දෙනු කොට් ඉසා (ලකුණු 10 යි)

නැතහොත්

පහත සඳහන් ශිලාලිපි කියවා වර්තමාන සිංහල අකුරින් ලියන්න.



(ලකුණු 10)

## II කොටස

02. මිහින්තලා ලෙන්ලිපිවලින් ප්‍රකට වන සිංහල ප්‍රාකෘතයේ භාෂා ලක්ෂණ මොනවාදැ යි සනිදර්ශනව විභාග කරන්න.

03. සිංහල භාෂා ඉතිහාසයේ 'මධ්‍යතන සිංහල අවධිය' සුවිශේෂ වන්නේ කවර කරුණු නිසාදැයි පැහැදිලි කරන්න.

04. 'ලක්දිව ලේඛන කලාවේ ආරම්භය ක්‍රි. පූ. 3වන සියවසේ සිද්ධ වූවකි.' විමර්ශනය කරන්න.

05. වේවැල්කැටිය පුවරු ලිපියෙන් හෙළිවන අතීත ලංකාවේ පැවති අධිකරණ නීති හා දඬුවම් ක්‍රම පිළිබඳ පැහැදිලි කරන්න.

නැතහොත්

පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. සිංහල ප්‍රාකෘත අවධියේ භාවිත බ්‍රාහ්මී අක්ෂර මාලාව
ii. බදුලු ටැම් ලිපිය
iii. මිහින්තලා ලෙන් ලිපිවලින් හෙළිවන අතීත ලක්දිව තොරතුරු
iv. නූතන සිංහලය කෙරෙහි බලපෑ යුරෝපීය භාෂාවන්ගේ බලපෑම

# <u>III කොටස</u>

06. ශ්‍රී ලාංකේය ශිල්ප කලාවන්ගේ ප්‍රභවය කෙරෙහි බලපෑ සමාජ හා සංස්කෘතික පරිසරය පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන්න.

07. බුද්ධ ප්‍රතිමාවේ ප්‍රභවය පිළිබඳ පවත්නා මතවාද මොනවාදැයි පැහැදිලි කොට, ලංකාවේ බුදුපිළිම කලාවේ සුවිශේෂතා මොනවාදැ යි සාකච්ඡා කරන්න.

08. දේශීය කලා නිර්මාණ ශිල්පීන්ගේ විශේෂ කුසලතා මෙන් ම අනන්‍යතාව ප්‍රකට කෙරෙන ප්‍රමුඛ නිර්මාණයක් ලෙස බෞද්ධ ස්තූප කලාව සැලකිය හැකි වන්නේ කවර හේතු නිසාදැයි පරීක්ෂා කරන්න.

09. චිත්‍රකලා ඉතිහාසයේ සීගිරි බිතුසිතුවම්වලට හිමිවන්නේ කෙබඳු ස්ථානයක්දැයි විමසන්න.

<u>නැතහොත්</u>

මහනුවර යුගයේ චිත්‍ර කලාවේ සුවිශේෂ ගතිලක්ෂණ පිළිබඳ විමසීමක් කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් <u>දෙකක්</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

- i. ඉසුරුමුණි කැටයම්
- ii. සඳකඩ පහණ
- iii. බෝධිඝර
- iv. කැලණි විහාරයේ චිත්‍ර

(02 - 10 දක්වා සෑම පිළිතුරකට ම ලකුණු 15 බැගිනි.)

****************************************